# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

**රටේ ආර්ථික ක්‍රියාකාරකම් යථාවත් වීම හේතුකොටගෙන, 2020 ජූනි මාසයට සාපේක්ෂව 2020 ජූලි මාසයේ දී නිෂ්පාදන සහ සේවා යන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක තව දුරටත් වර්ධනය විය.**

ව්‍යාපාර කටයුතු යථාවත් වීමත් සමඟ නිෂ්පාදන ක්‍රියාකාරකම් ක්‍රමයෙන් පූර්ව COVID මට්ටම් කරා ළඟා වෙමින් පවතින බව පිළිබිඹු කරමින් නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2020 ජූලි මාසයේදී 64.6ක අගයක් වාර්තා කරමින් අඛණ්ඩව ඉහළ යන ලදී. නිෂ්පාදනය සහ නව ඇණවුම් උපදර්ශක වල සිදුවූ ඉහළ යාම නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ඉහළ යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය.

2020 ජූලි මාසයේදී ලැබුණු නව ඇණවුම් හේතුවෙන් නව ඇණවුම් සහ නිෂ්පාදන උපදර්ශක අඩු වේගයකින් වුවද වර්ධනය විය. මේ අතර, මෙම වර්ධනයන්ට අනුකූලව සේවා නියුක්තිය ඉහළ යන ලදී.

ආර්ථික ක්‍රියාකාරකම් යථාවත් වීම හේතුකොටගෙන ඉදිරියේදී ඇතිවිය හැකි ඉල්ලුම සැලකිල්ලට ගනිමින් ඉදිරි නිෂ්පාදන අවශ්‍යතා සඳහා අවශ්‍ය තොග කල්තියා ඇණවුම් කිරීම හේතුවෙන් ගැනුම් තොග ඉහළ වේගයකින් වර්ධනය විය. තවද මෙම කාල සීමාව තුල දී ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය අඩු වේගයකින් ඉහළ යන ලදී.

| විචල්‍යය | ජූනි | ජූලි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **67.3** | **64.6** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ඇණවුම් | 73.7 | 69.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 77.4 | 73.7 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 51.6 | 51.6 | = | සමාන වේගයකින් ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 61.1 | 61.6 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 63.2 | 58.9 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඇතැම් වර්ගවල භාණ්ඩ ආනයනය කිරීම සඳහා පනවා ඇති සීමාවන් සමහර නිෂ්පාදන කටයුතුවලට අහිතකර ලෙස බලපා ඇති බව ප්‍රතිචාර දැක්වූවන් අවධාරණය කරන ලදී.


ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වන සමස්ථ අපේක්ෂාවන් පෙර මාසයට සාපේක්ෂව වැඩිවීමක් පෙන්නුම් කළ ද COVID-19 වසංගතය හේතුවෙන් විදේශීය ඉල්ලුම පහළ යාම ව්‍යාපාර කටයුතු කෙරෙහි තවදුරටත් බලපානු ඇති බව නිෂ්පාදකයින්ගේ මතය වේ.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**64.6**

**2020 ජූනි මාසයට සාපේක්ෂව දර්ශකාංක 2.7ක පහළ යෑමකි.**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2020 ජූනි මාසයට සාපේක්ෂව දර්ශකාංක 2.4 කින් ඉහළ යමින් 2020 ජූලි මාසයේදී 50.3 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

COVID 19 වෛරසයේ අහිතකර බලපෑම හේතුවෙන් 2020 ජූලි මාසයේදී රුසියාව සහ ඉන්දියාවේ නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය තව දුරටත් පහළ මට්ටමක පැවති අතර යුරෝපා කලාපය, එක්සත් රාජධානිය, චීනය සහ එක්සත් ජනපදයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ඉහළ යන ලදී.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2020 අගෝස්තු 17 වන දිනට*

[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් *30* කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

සේවා අංශයෙහි වර්ධනයක් අඛණ්ඩව දෙවන මාසයටත් පෙන්නුම් කරමින්, ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2020 ජූලි මාසයේ දී 51.4ක් දක්වා ඉහළ යන ලදී. 2020 ජූනි මාසයට සාපේක්ෂව නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි සිදු වූ ඉහළ යෑම මෙම වර්ධනය සඳහා දායක වූ අතර, එමගින් COVID-19 වසංගතය හේතුවෙන් පසුබෑමකට ලක් වූ සේවා අංශය තවදුරටත් යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කෙරේ.

ආර්ථික කටයුතු ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමග, ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා සහ රක්ෂණ උපඅංශයන්හි නව ව්‍යාපාර 2020 ජූලි මාසයේ දී ඉහළ ගියේය.

සේවා කටයුතු පුළුල් වශයෙන් යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කරමින් බොහොමයක් උපඅංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම් 2020 ජූලි මාසය තුළ දී ඉහළ ගියේය. මූල්‍ය පහසුකම් සැපයීම ඉහළ යෑම හේතුවෙන් පසුගිය මාසයට සාපේක්ෂව 2020 ජූලි මාසයේ දී මූල්‍ය සේවා උපඅංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් වර්ධනය විය. තවද, දේශීය සංචාරකයන් ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන් නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා උපඅංශයෙහි ද පසුගිය මාසයට සාපේක්ෂව වර්ධනයක් දක්නට ලැබුණි. තොග හා සිල්ලර වෙළඳාම, සෞඛ්‍ය සේවා සහ සන්නිවේදන උපඅංශවල ද 2020 ජූලි මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කළේය. කෙසේ වුවද, නැව් භාණ්ඩ මෙහෙයවීම් සහ ආනයන වෙළඳාම යන උපඅංශවලට අයත් ප්‍රතිචාර දක්වන්නන් විසින්, අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ සම්බන්ධයෙන් පනවා ඇති සීමා හේතුවෙන් පැනනැගී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව සඳහන් කරන ලදී.

නව බඳවාගැනීම් සිදු නොකිරීම හේතුවෙන් 2020 ජූලි මාසයේ දී සේවා නියුක්තිය අඛණ්ඩව හයවන මාසයටත් පහළ ගියේය.

තවද, බොහොමයක් ආයතන සාමාන්‍ය පරිදි මෙහෙයුම් කටයුතු සිදු කිරීම හේතුවෙන් නිමකිරීමට නියමිත කාර්යයන් 2020 ජූලි මාසයේ දී පහළ ගියේය.

| විචල්‍යය | ජූනි | ජූලි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **50.4** | **51.4** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 53.6 | 53.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 54.5 | 61.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 34.7 | 40.0 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 48.4 | 36.8 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 60.7 | 65.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


මේ අතර, ඉදිරි කාලයේ දී ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම පිළිබඳ පවත්නා සුබවාදී අදහස් සමග, අනාගත ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂා 2020 ජූලි මාසයේ දී ඉහළ ගියේය.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**51.4**

**2020 ජූනි මාසයට සාපේක්ෂව දර්ශකාංක 1.0ක ඉහළ යෑමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

සේවා අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2020 ජූනි මාසයේ දී වාර්තා වූ 48.0හි සිට 2020 ජූලි මාසයේ දී 50.5 දක්වා ඉහළ ගිය අතර, එය 2020 ජනවාරි මාසයට පසුව ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි ඉහළ යෑමක් පෙන්නුම් කළ පළමු අවස්ථාවයි.

චීනය සහ එක්සත් රාජධානිය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින්, එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2020 ජූලි මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, ජපානය සහ ඉන්දියාව යන රටවල එය පහළ යෑමක් පෙන්නුම් කළේය. ඇමරිකා එක්සත් ජනපදයෙහි සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය කඩඉම් මට්ටම වන 50.0ක් ලෙස වාර්තා විය.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2020 අගෝස්තු 17 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.